# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2157/3 - 2020 ජනවාරි මස 06 වැනි සඳුදා - 2020.01.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.21/1978(X)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති ලියාපදිංචි අංක පී.වී. 101137 දරන සමාගමක් වන එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2019 මැයි මස 2 වන දින අංක 2121/44 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

I වන උපලේඛනය

***කොන්දේසි***

1. එස්.එල්.ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිවලට අදාළ උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී -

(i) සංචාරක හා සංචාරක කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී සංචාරක හා සංචාරක කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව, ඊ - සංචාරක හා ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව යන උපාධි පාඨමාලා සඳහා -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ ව්‍යාපාර අධ්‍යයනය ඇතුළුව, සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇඳුනු පාඨමාලාවක් සමඟ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.


1A - PG 4840 — 517 (2020/01)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

I වන උපලේඛනය *(සම්බන්ධිතයි)*

(ii) යාන්ත්‍රි විද්‍යුත් පිළිබඳ ඉංජිනේරු විද්‍යා ගෞරව උපාධි පාඨමාලාව සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යාව විෂයය ධාරාව යටතේ සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

(iii) කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හෝ තාක්ෂණය විෂයය ධාරාව යටතේ සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධි පිරිනැමීම සඳහා එස්.එල්.ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

*II වන උපලේඛනය*

| 1 වන තීරය<br>උපාධිය | 11 වන තීරය<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| සංචාරක හා සංචාරක කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී | බීඑස්සී (සංචාරක හා සංචාරක කළමනාකරණය) |
| සංචාරක හා සංචාරක කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) | බීඑස්සී (ගෞරව) (සංචාරක හා සංචාරක කළමනාකරණය) |
| ඊ- සංචාරක හා ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) | බීඑස්සී (ගෞරව)(ඊ-සංචාරක හා ඩිජිටල් අලෙවිකරණය) |
| යාන්ත්‍රි විද්‍යුත් පිළිබඳ ඉංජිනේරු විද්‍යා (ගෞරව) | බීඑස්සී (ගෞරව) ඉංජිනේරු (යාන්ත්‍රි විද්‍යුත්) |
| කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) | බීටෙක් (ගෞරව) (කෘෂිකාර්මික තාක්ෂණ) |

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

01 - 529/1

---

එල්.ඩී.බී.21/1978(X)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති ලියාපදිංචි අංක පී.වී. 94125 දරන සමාගමක් වන නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2015 දෙසැම්බර් මස 7 වන දින අංක 1944/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම, මෙහි II වන

උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

I වන උපලේඛනය

***කොන්දේසි***

1. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචකයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වෙන උපාධිය පිරිනැමීම සඳහා නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

2. නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) නියම කරනු ලැබ ඇති ආකාරයෙන් පහත සඳහන් අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලින් එක් සුදුසුකමකට අනුකූලව කටයුතු කළ යුතුය ඃ-

(අ) ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයකදී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ දර්ශනපති උපාධිය සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ;

(ආ) ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයකදී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ ශාස්ත්‍රපති උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ;

(ඇ) GPA අගය 0-4 ක පරිමාණයකින් අවම වශයෙන් 3.0 අගයක් සමඟ ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ SLQF 6 වන මට්ටමෙහි ගෞරව උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ;

(ඇ) යම් තැනැත්තකුගේ පර්යේෂණ නිපුණතා සම්බන්ධයෙන් වන සුවිශේෂී කුසලතා මත වසරක අවම කාලසීමාවකින් පසු ආචාර්ය උපාධි මට්ටම දක්වා උසස් කළ හැකි දර්ශනපති උපාධියක් නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ දී හැදෑරීම සඳහා ලබාගත් වලංගු ලියාපදිංචියක් සමඟ ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ SLQF 6 වන මට්ටමෙහි ගෞරව උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ; හෝ

(ඉ) යම් පුද්ගලයකුගේ පර්යේෂණ නිපුණතා සම්බන්ධයෙන් වන සුවිශේෂී කුසලතා මත වසරක අවම කාලසීමාවකින් පසු ආචාර්ය උපාධි මට්ටම දක්වා උසස් කළ හැකි දර්ශනපති උපාධියක් නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ දී හැදෑරීම සඳහා ලබාගත් වලංගු ලියාපදිංචියක් සමඟ GPA අගය 0-4 ක පරිමාණයකින් අවම වශයෙන් 3.0 අගයක් සමඟ ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ SLQF 5 වන මට්ටමෙහි උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ SLQF 6 වන මට්ටමට සමාන වන ආකාරයේ අධ්‍යයන සම්භාර 30ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පවත්වනු ලබන සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

II වන උපලේඛනය

| I වන තීරය<br>උපාධිය | II වන තීරය<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ආචාර්ය | පීඑච්ඩී (බෞද්ධ අධ්‍යයනය) |

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

01 - 529/2

---

එල්.ඩී.බී.21/1978(X)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති ලියාපදිංචි අංක පී.වී. 17745 දරන සමාගමක් වන සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2019 මැයි මස 2 වන දින අංක 2121/45 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

I වන උපලේඛනය

***කොන්දේසි***

1. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිවලට අදාළ උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී -

(i) මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යා විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇදුනු පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය ;

(ii) ව්‍යාපාර හා කාර්මික ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යා විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

II වන උපලේඛනය *(සම්බන්ධිතයි)*

(iii) බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සඳහා -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ වාණිජ්‍ය විද්‍යා විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇදුනු පාඨමාලාවක් සමඟ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වෙන උපාධි පිරිනැමීම සඳහා සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

*II වන උපලේඛනය*

| I වන තීරය<br>උපාධිය | II වන තීරය<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (මෘදුකාංග ඉංජිනේරු) |
| ව්‍යාපාර හා කාර්මික ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ව්‍යාපාර හා කාර්මික ගණිතය) |
| බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව | බීබීඑම් ගෞරව (බැංකුකරණය හා මූල්‍ය) |

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

01-529/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.